# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
## විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2011/ 2012 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඇතුලත් කර ගැනීම පිණිස, 2011 අගෝස්තු මස පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට දැනටමත් අයදුම්කර ඇති අයදුම්කරුවන්ට, ඔවුන් මුල් අවස්ථාවේදී පාඨමාලාවලට දී තිබූ කැමැත්තේ අනුපිළිවෙල වෙනස් කිරීමට සහ අයදුම් නොකරන ලද පාඨමාලාවකට අයදුම්කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා අවසර දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත.

ඒ සම්බන්ධයෙන් ඉල්ලීම් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් පහත සඳහන් ආදර්ශය අනුව පිළියෙල කල ලිඛිත ඉල්ලීමක් අතිරේක ලේකම් ( අධ්‍යයන කටයුතු හා විශ්වවිද්‍යාල ප්‍රවේශ), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් **2012.09.28 වන දින හෝ එදිනට පෙර** එවිය යුතුය.

**2012.09.28 වන දිනෙන් පසු කැමැත්තේ අනුපිළිවෙල වෙනස් කිරීම සඳහා සහ අයදුම් නොකරන ලද පාඨමාලාවකට අයදුම් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන කිසිදු ඉල්ලීමක් කිසිදු හේතුවක් මත සලකා බලනු නොලැබේ.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
විශ්වවිද්‍යාල ප්‍රවේශය අධ්‍යයන වර්ෂය 2011/2012
[2011 අ.පො.ස.(උ.පෙළ) විභාග ප්‍රතිඵල මත]

**பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு**
**பல்கலைக்கழக அனுமதிகள் - கல்வியாண்டு 2011/2012**
**[க.பொ.த. (உ/த) 2011இன் அடிப்படையில்]**

**UNIVERSITY GRANTS COMMISSION**
**UNIVERSITY ADMISSION - ACADEMIC YEAR 2011/2012**
**[Based on the results of the G.C.E. (A/L) Examination held in 2011]**

කැමැත්තේ අනුපිළිවෙළ වෙනස් කිරීම සහ නව පාඨමාලා අයදුම් කිරීම සඳහා ආදර්ශ අයදුම්පත්‍රය
**கற்கைநெறிஒழுங்கைமாற்றுவதற்கானமற்றும் புதியகற்கைநெறிகளுக்குவிண்ணப்பிப்பதற்கானமாதிரிபடிவஅமைப்பு**
**Format for Change the order of Course Preferences and to apply for new courses of study (Specimen)**

---

1. අ.පො.ස (උසස් පෙළ) විභාග අංකය (2011) :
க.பொ.த. (உ/த) சுட்டெண் (2011) :
G.C.E. (A/L) Index Number (2011) :

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

2. සම්පූර්ණ නම :
முழுப்பெயர் :
Full Name :

3. ජාතික හැඳුනුම්පත් අංකය :
தேசிய அடையாள அட்டை இல. :
National Identity Card No. :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

දුරකථන අංකය :
தொலைபேசி இலக்கம்:
Telephone Number :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

| | Course of Study (Code) | | Order of University Preference (University Code) 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | |
| 4 | | | | | | | | | | | | |
| 5 | | | | | | | | | | | | |
| 6 | | | | | | | | | | | | |
| 7 | | | | | | | | | | | | |
| 8 | | | | | | | | | | | | |
| 9 | | | | | | | | | | | | |
| 10 | | | | | | | | | | | | |
| 11 | | | | | | | | | | | | |
| 12 | | | | | | | | | | | | |
| 13 | | | | | | | | | | | | |
| 14 | | | | | | | | | | | | |
| 15 | | | | | | | | | | | | |
| 16 | | | | | | | | | | | | |
| 17 | | | | | | | | | | | | |
| 18 | | | | | | | | | | | | |
| 19 | | | | | | | | | | | | |
| 20 | | | | | | | | | | | | |
| 21 | | | | | | | | | | | | |
| 22 | | | | | | | | | | | | |
| 23 | | | | | | | | | | | | |
| 24 | | | | | | | | | | | | |
| 25 | | | | | | | | | | | | |

මා විසින් මීට පෙර සඳහන් කරන ලද කැමැත්තේ අනුපිළිවෙල අවලංගු කර ඉහත මා සඳහන් කරන නව කැමැත්තේ අනුපිළිවෙල විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බලන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමි. இத்தால் நான் எனது முந்திய கற்கைநெறி / பல்கலைக்கழக விருப்பு ஒழுங்கை ரத்து செய்கிறேன். தயவு செய்து மேலே குறிப்பிட்ட புதிய கற்கைநெறி / பல்கலைக்கழக விருப்பு ஒழுங்கை எனது புதிய விருப்பு ஒழுங்காக கருத்திற்கெடுக்கவும். I do hereby cancel my previous course/university preferences. Please consider the new order of course/University preference as indicated above for university admission.

..................................
**දිනය / திகதி / Date**

..................................................................
**අත්සන / கையொப்பம் / Signature**

තවද, 2011 අ.පො.ස.(උසස් පෙළ) විභාග ප්‍රතිඵල මත 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් ඉදිරිපත් කර නොමැති අයදුම්කරුවන් සඳහා ප්‍රවේශ අයදුම්පත් නිකුත් කිරීමට ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත.

**<u>ඉතා වැදගත්</u>**

**2011 අ.පො.ස.(උසස් පෙළ) විභාග ප්‍රතිඵල මත 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා දැනටමත් ප්‍රවේශ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් වැළකිය යුතුය.**

ඒ අනුව පහත (I) යටතේ දක්වා ඇති විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අදහස් කරන අයදුම්කරුවන් **<u>2012.09.14 වන දින සිට 2012.09.28 වන දින දක්වා</u>, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 ලිපිනයට පැමිණ** රු. 300 ක් ගෙවා ලබා ගත් විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත සමග නිකුත් කරන ප්‍රවේශ අයදුම්පත්‍රය භාවිතා කර විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කළ යුතුය.

එසේම විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් තැපැල් මගින්ද **<u>2012.09.14 වන දින සිට 2012.09.26 වන දින දක්වා</u>** ලබා ගත හැකිය. ඒ සඳහා ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස් කිරීමේ ගිණුම් අංක 0002323287 ට හෝ මහජන බැංකුවේ පුරහල ශාඛාවේ රැස්කිරීමේ ගිණුම් අංක 167-1-001-4-3169407ට බැර වනසේ, ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු.300/= ගෙවා ලබා ගත් කුවිතාන්සියක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලය වෙත එවිය යුතුය. එසේ බැංකු කුවිතාන්සියක් එවා අයදුම්පත් තැපැල් මගින් ලබා ගැනීමේදී, අයදුම්කරුගේ නම, අ.පො.ස.(උසස් පෙළ) විභාග අංකය හා ප්‍රවේශය සම්බන්ධ උපදෙස් මාලාව අයදුම්කරුට අවශ්‍යය මාධ්‍යය සඳහන් කර තමාගේ ලිපිනය ලියනලද මුද්දර නොගැසූ 35 cm X 24 cm ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග ලිඛිත ඉල්ලීමක් අයදුම්කරුවන් විසින් අතිරේක ලේකම් (අධ්‍යයන කටයුතු හා විශ්වවිද්‍යාල ප්‍රවේශ), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 ලිපිනයට ඉදිරිපත් කළ යුතු අතර නියමිත මුදල් ගෙවූ බවට බැංකු ශාඛාවේ මුද්‍රාව තබා බලය ලත් නිළධාරියකු විසින් බැංකු කුවිතාන්සිය අත්සන් කර තිබිය යුතුය. **<u>අයදුම්පත් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන තැපැල් ඇණවුම් හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.</u>**

**(I) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම්:**

විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති, පහත සඳහන් සුදුසුකම් සපුරා ලූ අපේක්ෂකයන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබති.

(අ) අනුමත විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(ආ) පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රයෙන් 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබිය යුතුය.

**<u>සටහන 1:</u>** **කෙසේ වෙතත් , ඉහත (ආ) සම්පූර්ණ නොකිරීම හේතුවෙන් විභාග කොමසාරිස් ජනරාල් වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම ලබා නොමැති බවට නිවේදනය කර ඇති අපේක්ෂකයන්ටද, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීමට අනුමත අ.පො.ස.(උ.පෙළ) අවස්ථා තුනෙන් එක් වතාවකදී හෝ පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් දැනටමත් ලබා ඇත්නම් හෝ ඉදිරියේදී ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ හැකිය.**

**<u>සටහන 2:</u>** 2010 හෝ ඊට පෙර වසරකදී පවත්වන ලද අ.පො.ස.(උසස් පෙළ) විභාගයක ප්‍රතිඵල මත ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යටතේ පවත්නා ආයතනයක් මගින් පවත්වනු ලබන තුන් අවුරුදු හෝ ඊට වැඩි කාලයක උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ තාක්ෂණඥයන් පුහුණු කිරීමේ ආයතනයේ ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව පූර්ණ කාලීනව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටි, එහෙත් ලියාපදිංචිය සඳහා දී තිබූ අවසාන දින සිට දින 60ක් ඇතුලත එම ලියාපදිංචිය අවලංගු කර ගත් සිසුන්ට 2011 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කල හැකිය. එවැනි අයදුම්කරුවන් අදාළ ලියාපදිංචිය අවලංගු කර ගත්

බවට අදාළ ආයතනය මගින් නිකුත් කරනු ලබන ලිපියේ පිටපතක් අයදුම්පත සමඟ එවිය යුතුය.
කෙසේ වෙතත්, පූරප්පාඩු පිරවීමේදී ඉහත සඳහන් කරන ලද ආයතනයන් සඳහා තෝරා ගැනෙන සිසුන්ට මෙම සහනය නොලැබේ.

**අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය :**

**අයදුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනය 2012.09.28 වන දින වේ** . සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අතිරේක ලේකම් (අධ්‍යයන කටයුතු හා විශ්වවිද්‍යාල ප්‍රවේශ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස , කොළඹ 07, ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් පැමිණ භාර දිය යුතුය. **2012.09.28 වන දිනෙන් පසුව අයදුම්පත් බාරගනු නොලැබේ**.

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
අංක 20, වෝඩ් පෙදෙස ,
කොළඹ 07.
2012.09.14